සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 13 - 2023

විභාග අංකය: ....................................

## ශ්‍රී ලංකා ඉතිහාසය – I
(ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා)

කාලය පැය 01 යි

උපදෙස් :-
- මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ. සියළු ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුත් නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමග අමුණා භාර දෙන්න.

---

- අංක 01 සිට 10 තෙක් ඇති ප්‍රශ්න සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැලපේ. එම නොගැලපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන් තුළ ලියන්න.

01 (1) තම්බපණ්ණි (2) අනුරාධගාම (3) උරුවේල ගාම
(4) දීඝ ගාම (5) උපතිස්ස ගාම (.......)

02 (1) ජිනකාලමාලි (2) සමන්තපාසාදිකාව (3) සම්මෝහවිනෝදනිය
(4) සාරත්ථදීපනී (5) මනෝරථපූරණී (.......)

03 (1) පල්ලවවංක (2) ගෝකණ්ණ (3) ලංකාපටුන
(4) සලාවත්තොට (5) මඩකළපුව (.......)

04 (1) කොස්මස් (2) සුලයිමාන් (3) අබුසයිද්
(4) අල්බිරූනී (5) මසූදි (.......)

05 (1) ලංකාතිලක (2) තිවංක පිළිමගෙය (3) ලංකාරාමය
(4) උත්තරාරාමය (5) ථූපාරාම පිළිමගෙය (.......)

06 (1) නිශ්ශංකමල්ල (2) වීරබාහු (3) ධර්මාශෝක
(4) සහස්සමල්ල (5) ඉලනාග (.......)

07 (1) පූජාවලිය (2) එළු බෝධි වංසය (3) අනාගත වංසය
(4) දළදා සිරිත (5) ධාතුමංජුසාව (.......)

08 (1) පැරිස්පාසල් (2) සෙමනේරිය (3) එස්පිරිටල්
(4) මඩම් (5) කපිරිඥ්ඥා (.......)

09 (1) පේරෝලෝපේස් ද සූසා (2) දොන් ජෙරෙනිමෝ ද අසවේදු (3) කොන්ස්තන්තූ ද සා
(4) ජොරිස් වැන් ස්පිල්බර්ජන් (5) දියෝගෝ ද මෙලෝ (.......)

10 (1) සාප්පු බද්ද (2) ඔරු බද්ද (3) පොල්ගස් බද්ද
(4) තුවක්කු බද්ද (5) ඇඟ බද්ද (.......)

- **අංක 11 සිට 15 තෙක් වූ ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නො ගැළපේ. එම නො ගැළපෙන පද යුගලය කුමක් දැ යි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියෙන් ඇති වරහන් තුළ ලියන්න.**

11 (1) සැස්සේරුව ලිපිය - වෙළෙඳ ශ්‍රේණි පිළිබඳ තොරතුරු
(2) ගොඩවාය ලිපිය - තීරු බදු පිළිබඳ තොරතුරු
(3) පරමාකන්ද ලිපිය - ඇමතිවරු පිළිබඳ තොරතුරු
(4) සිතුල්පව්ව ලිපිය - සේනාපතිවරු පිළිබඳ තොරතුරු
(5) මහ ඇලගමුව ලිපිය - වසභ රජුගේ දරුවන් පිළිබඳ තොරතුරු (.......)

12 (1) වංකනාසිකතිස්ස - අනුරාධපුරය
(2) පළමුවන බුවනෙකබාහු - දඹදෙණිය
(3) පරාක්‍රම පාණ්ඩ්‍ය - යාපනය
(4) දෙවන විජයබාහු - පොළොන්නරුව
(5) හයවන විජයබාහු - කෝට්ටේ (.......)

13 (1) සිදත් සඟරාව - සිංහල ව්‍යාකරණ
(2) කව්සිළුමිණ - වෛද්‍ය විද්‍යාව පිළිබඳ තොරතුරු
(3) එළු සඳැස්ලකුණ - කාව්‍යකරණය පිළිබඳ නීති
(4) දඹදෙණි කතිකාවත - භික්ෂු විනය නීතිරීති
(5) කඳවුරු සිරිත - දෙවන පැරකුම්රජුගේ දින චරියාව (.......)

14 (1) පෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා - තැපැල් දෙපාර්තමේන්තුව පිහිටුවීම
(2) වෙස්ට් රිජ්වේ ආණ්ඩුකාරවරයා - කෘෂිකාර්මාන්ත දෙපාර්තමේන්තුව පිහිටුවීම
(3) මැකන්සි ආණ්ඩුකාරවරයා - කොළඹ ඇකඩමිය පිහිටුවීම
(4) ටොරින්ටන් ආණ්ඩුකාරවරයා - තුවක්කු බද්ද පැනවීම
(5) හියු ක්ලිපර්ඩ් ආණ්ඩුකාරවරයා - ඩොනමෝර් කොමිසම ලංකාවේ පිහිටුවීම (.......)

15 (1) එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක - සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත්කිරීම.
(2) ජෝන් කොතලාවල - වතු කම්කරු ගැටළු විසඳීම සඳහා නේරු තුමා සමඟ ගිවිසුමක් අත්සන් කිරීම.
(3) සිරිමාවෝ බණ්ඩාරනායක - පළමු ජනරජ ව්‍යවස්ථාව හඳුන්වා දීම.
(4) ජේ.ආර්. ජයවර්ධන - විධායක ජනාධිපති ධූරය ස්ථාපිත කිරීම.
(5) ඩඩ්ලි සේනානායක - වතු කම්කරු ගැටළු විසඳීමට ශාස්ත්‍රී මහතා සමඟ ගිවිසුම්ගත වීම. (.......)

- **අංක 16 සිට 20 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දක්වා ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නො වේ. Y තීරුව X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදි ය. එම නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන් තුළ ලියන්න.**

(16)

| | x | | y |
|---|---|---|---|
| 1. | මින්නේරිය වැව | A | බාණු වාපී |
| 2. | මහකනදරා වැව | B | ජල්ලුර වාපී |
| 3. | පඬා වැව | C | මිණිහිරවාපී |
| 4. | නාච්චදූව වැව | D | පත්පහන් වැව |
| 5. | හුරුළු වැව | E | බෑණ සමුද්‍රය |

(1) AEDBC (2) BACED (3) CAEDB (4) DBCAE (5) EDBCA (......)

| | | x | | y |
|---|---|---|---|---|
| 17 | 1. | සද්ධර්මරත්නාවලිය | A | අනෝමදස්සී හිමි |
| | 2. | යෝගාර්ණවය | B | කුමාරදාස රජු |
| | 3. | ජානකීහරණය | C | වේදේහ හිමි |
| | 4. | රසවාහිනී | D | ධර්මසේන හිමි |
| | 5. | දෛවඥකාමධේනු | E | බුද්ධපුත්‍ර හිමි |

(1) AEDBC (2) BACED (3) CAEDB (4) DEBCA (5) EDBCA (......)

| | | x | | y |
|---|---|---|---|---|
| 18 | 1. | අඹගමුව සෙල්ලිපිය | A | පාලකයන් දෙදෙනෙකු අතර සිදු වූ එකඟතාවයක් |
| | 2. | කළුදිය පොකුණ සෙල්ලිපිය | B | විජයබාහු රජු ශ්‍රී පාදයට සිදු කරන ලද අනුග්‍රහයක් |
| | 3. | බදුළු ටැම් ලිපිය | C | භික්ෂූන් සඳහා වූ උපදෙස් |
| | 4. | සංගමු විහාර ලිපිය | D | වෙළෙඳ පොළක පාලනය |
| | 5. | දෙවනගල සෙල්ලිපිය | E | පැරකුම් රජුගේ බුරුම ආක්‍රමණය පිළිබඳ තොරතුරු |

(1) ABECD (2) BCDAE (3) CABED (4) CDABE (5) EDCBA (......)

| | | x | | y |
|---|---|---|---|---|
| 19 | 1. | යමසිංහ බණ්ඩාර | A | කන්නසාමි |
| | 2. | කොනප්පු බණ්ඩාර | B | ටිකිරි බණ්ඩාර |
| | 3. | ධර්මපාල | C | ඕස්ට්‍රියාවේ දොන් ජුවන් |
| | 4. | පළමු රාජසිංහ | D | දොන් ජුවන් ප්‍රොසෙන්දරා |
| | 5. | ශ්‍රී වික්‍රම රාජසිංහ | E | දොන් පිලිප් |

(1) ABDCE (2) CADBE (3) CBADE (4) CEDBA (5) ECDBA (......)

| | | x | | y |
|---|---|---|---|---|
| 20 | 1. | කොට්ටල් බද්ද | A | ශිල්පීන් පිළිබඳ කාර්යාංශය |
| | 2. | රදා බද්ද | B | රෙදි සේදීමේ කාර්යාංශය |
| | 3. | මඩිගෙ බද්ද | C | රෙදි විවීමේ කාර්යාංශය |
| | 4. | හැද බද්ද | D | ප්‍රවාහන කටයුතු කාර්යාංශය |
| | 5. | කින්නර බද්ද | E | විවීමේ කාර්යාංශය |

(1) ABDCE (2) BCDAE (3) DABEC (4) DBACE (5) EABDC (......)

- **අංක 21 - 25 තෙක් වූ සෑම ප්‍රශ්නයකටම නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

21 දුටුගැමුණු රජතුමා ලංකාව එක්සේසත් කිරීම,
(1) කාවන්තිස්ස රජතුමා රෝහණය එක්සත් කොට ශක්තිමත් පදනමක් ඇතිකිරීම.
(2) විහාර මහා දේවියගේ හා භික්ෂූන් වහන්සේලාගේ උපදේශකත්වය.
(3) දස බෑ රජවරුන් පරදවා කතරගම බලය ලබාගැනීම.
(4) පරුමක වරුන්ගේ සහයෝගය.
(5) ද්වන්ධව සටනකින් එළාර පරාජය කිරීම. (......)

22 අනුරාධපුර යුගයේ ඇතිවූ ඉන්දියානු සබඳතා,
(1) මහින්දාගමනය හා බුදුදහම ස්ථාපිත වීම.
(2) දේවානම්පියතිස්ස රජු අශෝක අධිරාජයා සමඟ මිත්‍ර සම්බන්ධතා ඇතිකර ගැනීම.
(3) මෞර්ය අභිෂේක ක්‍රමය දායාද වීම.
(4) මෞර්ය පාලන ක්‍රමය, විරුද නාම දායාද වීම.
(5) කාලිංග මාඝගේ ආක්‍රමණය. (......)

23 ගම්පොළ රාජධානි සමය,

(1) හතරවන බුවනෙකබාහු ආරම්භක පාලකයා වීම.

(2) ගම්පොළට සමගාමීව දැදිගම ප්‍රදේශය පස්වන පැරකුම් පාලනය කිරීම.

(3) සේනාධිලංකාර සෙනෙවි විසින් ලංකාතිලක විහාරය කරවීම.

(4) නිශ්ශංක අලගක්කෝනාර වික්‍රමබාහු රජුගේ සහෝදරිය හා විවාහ වීම.

(5) වික්‍රමබාහු රජු පලවාහැර පස්වන පැරකුම් ගම්පොළ බලය අල්ලා ගැනීම. (......)

24 බ්‍රිතාන්‍ය පාලන සමයේ ප්‍රවාහන හා සන්නිවේදන ක්‍රමවල සිදුවූ දියුණුව,

(1) 1925 වසරේ දී ගුවන් විදුලිය හඳුන්වා දීම.

(2) රජයේ වෙළෙඳ ඒකාධිකාරය අහෝසිකිරීම.

(3) තලෙයිමන්නාරම සිට ධනුෂ්කොඩි තෙක් බෝට්ටු සේවයක් ආරම්භ කිරීම.

(4) කොළඹ වරාය කටයුතු දියුණු කිරීම.

(5) අශ්ව කරත්ත තැපැල් සේවය ආරම්භ කිරීම. (......)

25 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලිකාංග,

(1) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය.

(2) රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම පිහිටුවීම.

(3) ද්විමාණ්ඩලික පාර්ලිමේන්තුව.

(4) අග්‍රාණ්ඩුකාර ධූරය වෙනුවට ආණ්ඩුකාර ධූරයක් ස්ථාපනය කිරීම.

(5) උත්තර මන්ත්‍රී මණ්ඩලයක් හඳුන්වා දීම. (......)

- **අංක 26 සිට 30 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති A, B, C සහ D යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

**A සහ B පමණක් නිවැරදි නම් අංක 01**

**A සහ C පමණක් නිවැරදි නම් අංක 02**

**B සහ C පමණක් නිවැරදි නම් අංක 03**

**C සහ D පමණක් නිවැරදි නම් අංක 04**

**ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් අංක 05 ද වරහන් තුළ ලියන්න.**

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) |
| (A) සහ (B) පමණක් නිවැරදියි. | (A) සහ (C) පමණක් නිවැරදියි. | (B) සහ (C) පමණක් නිවැරදියි. | (C) සහ (D) පමණක් නිවැරදියි. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදියි. |

26 ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මඟින් පමණක් තොරතුරු අනාවරණය වේ.

(B) ක්‍රි.පූ. 600-500 අතර කාල සීමාව යුගයේ ආරම්භක කාල වකවානුව වේ.

(C) මෙම යුගයේ දී ඉන්දියානු ජන කණ්ඩායම් ලංකාවට පැමිණ ජනාවාස පිහිටුවා ගන්නා ලදී.

(D) ශ්‍රී ලංකාව ජනාවාස වීම ආරම්භ වූයේ ආර්යයන්ගේ ලංකාගමනයත් සමඟය. (......)

27 සීතාවක රාජධානියේ ඉතිහාසය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) සීතාවක රාජධානියේ ආරම්භකයා වන්නේ මායාදුන්නේ රජුය.

(B) සිංහල සංගයේ ප්‍රතිඵලයක් ලෙස රාජධානිය ආරම්භ විය.

(C) සීතාවක පාලකයන් පෘතුගීසීන්ට විරුද්ධය කළ සටහන් වලදී සැමොරින් පාලකයාගේ සහය හිමි විය.

(D) පළමුවන විමලධර්මසූරිය රජු සීතාවක රාජධානිය ආක්‍රමණය කර අල්ලා ගන්නා ලදී. (......)

28 කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) සියම් නිකායේ ආරම්භය.

(B) වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ පදවිය පිරිනැමීම.

(C) මුහුදුබඩ ප්‍රදේශයේ බ්‍රිතාන්‍ය විරෝධී අරගලයට සහය ලබාදීම.

(D) විජය රාජසිංහ රජුගේ සහෝදරයා වීම. (......)

29 කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම.

(B) පෞද්ගලික ව්‍යවසාය පදනම් කරගත් රාජ්‍ය නිර්බාදවාදී ප්‍රතිපත්තියක් හඳුන්වා දීම.

(C) උඩරට හා පහතරට ඒකාබද්ධ කළ පාලන ක්‍රමයක් හඳුන්වා දීම.

(D) මුළු රටට ම බලපාන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ බලය ව්‍යාප්ත කිරීම. (......)

30 ශ්‍රී ලංකාවේ මිෂනාරී ව්‍යාපාරය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) වැලිවිට සරණංකර හිමියන් බෞද්ධ පුනර්ජීවනයට පදනම දැමීම.

(B) ඕල්කට් තුමා විසින් පරම විඥානාර්ථ සමාගම පිහිටු වීම.

(C) විවිධ පුවත්පත් හා සඟරා මුද්‍රණය කොට බෙදා හැරීම.

(D) ක්‍රිස්තු භක්තිකයන්ට හා රෝමානු කතෝලිකයන්ට විශේෂ වරප්‍රසාද ලබා දීම. (......)

- **අංක 31 සිට 35 තෙක් වූ සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැලපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

31 පොළොන්නරුවේ තෙවරක් බලයට පත් රැජිනිය කවුරුන් ද?

(1) ලීලාවතී (2) අනුලා (3) සුගලා

(4) කල්‍යාණවතී (5) සර්වාංගසුන්දරී (......)

32 ලංකාවේ විශාලතම දාගැබ වන්නේ,

(1) රුවන්වැලි සෑයයි (2) අභයගිරිය යි (3) ජේතවනාරාමය යි

(4) මිරිසවැටිය යි (5) කතරගම කිරිවෙහෙරයි (......)

33 චීනයේ චෙන් හෝ සෙනෙවියා රට ආක්‍රමණය කළ අවධියේ එහි පාලකයා ලෙස කටයුතු කරන ලද්දේ කවරෙක් ද?

(1) නිශ්ශංක අලකේශ්වර (2) වීර අලකේශ්වර (3) කුමාර අලකේශ්වර

(4) අල්කෝර් (5) දේවමන්දි අලකේශ්වර (......)

34 රත්මලානේ ධර්මාරාම හිමියන්ගේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලද පිරිවෙන කුමක් ද?

(1) රත්මලානේ පරමධම්මචේතිය (2) මාලිගාකන්දේ විද්‍යෝදය (3) පැලියගොඩ විද්‍යාලංකාර

(4) වස්කඩුවේ සුභූති (5) වීදාගම සණානන්ද (......)

35 ශ්‍රී ලංකාවේ පිහිට වූ පළමු කාර්මික ජනපදය කුමක් ද?

(1) ඒකල (2) තලවකැලේ (3) බියගම

- අංක 36 සිට 40 දක්වා වූ ප්‍රශ්නවලට අදාලව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැලපෙනුයේ පහත වගුවෙහි දක්වෙන 1, 2, 3, 4,5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාල අංකය වරහන් තුල ලියන්න.

| ප්‍රතිචාරය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදිය. | වැරදිය. |
| (2) | නිවැරදිය. | නිවැරදිය. |
| (3) | වැරදිය. | වැරදිය. |
| (4) | වැරදිය. | නිවැරදිය. |
| (5) | නිවැරදිය. | නිවැරදි වන අතර පළමුවැන්න මැනැවින් පහදා දෙයි. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 36 | කාවන්තිස්ස රජතුමා තම සහෝදරිය වූ සෝමා දේවිය සිහිවීම සඳහා සෝමාවතී දාගැබ ඉදිකරවන ලදී. | නිශ්ශංකමල්ල රජතුමා පොළොන්නරු කතිකාවත කරවා සංඝ සාමග්‍රියක් සිදුකරන ලදී. (......) |
| 37 | සංඝමිත්‍ර භික්ෂුවගේ උපදෙස් පරිදි මහසෙන් රජතුමා ජේතවන විහාරය විනාශ කරවන ලදී. | වළගම්බා රාජසමයේ දී බැමිණිතියා සාගතය නමින් දරුණු සාගතයක් ඇති විය. (......) |
| 38 | මැක්ඩෝවල් හා බාබට් සෙනෙවිවරුන්ගේ නායකත්වයෙන් හමුදා කණ්ඩායම් දෙකක් යටතේ 1803 වසරේ දී ඉංග්‍රීසීන් උඩරට ආක්‍රමණය කරන ලදී. | උඩරට බලය අල්ලාගත් ඉංග්‍රීසීන් මුත්තුසාමි කුමරු උඩරට රජු වශයෙන් පත්කළද පසුව සංවිධානය වූ උඩරට හමුදාවෝ උඩරටින් පළවාහරින ලදී. (......) |
| 39 | අටවන වීර පරාක්‍රමබාහු රජ දවස පෘතුගීසීන්ගේ ලංකාගමනය සිදුවිය. | ධර්මපාල රජතුමා විසින් තෑගි ඔප්පුවක් මගින් කෝට්ටේ රාජධානිය ඉංග්‍රීසීන් වෙත පවරාදෙන ලදී. (......) |
| 40 | ශ්‍රී ලංකාවට නිදහස ලැබීමත් සමග ලාංකික උගතුන් විසින් ලංකාවට උචිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කරගන්නා ලදී. | ඩී.එස්. සේනානායක මහතාගෙන් පසුව පුරප්පාඩු වූ අගමැති ධූරය සඳහා ජෝන් කොතලාවල මහතා පත්කරන ලදී. (......) |

(ල. 40)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023**
Third Term Test - Grade 13 - 2023

විභාග අංකය: ....................................

## ශ්‍රී ලංකා ඉතිහාසය – II
**(ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා)**

කාලය පැය 03 යි

උපදෙස්:-
- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

**(ප්‍රශ්න අංක 01 ට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් සපයා ඇත.)**

---

01 ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| (i) උඟරාතොට | (ii) කොට්ටියාරම | (iii) දඹදෙණිය | (iv) ගාල්ල |
| (v) හුරුළු වැව | (vi) ගම්පොළ | (vii) දෙවිනුවර | (viii) මීගමුව |
| (ix) දකුණු පළාත | (x) මාතලේ | (xi) ගල්ඔය | (xii) නල්ලූර් |

(නිවැරදි ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි) (ල. 12)

02 ''ශ්‍රී ලංකාවේ අඛණ්ඩ ඉතිහාසය හැදෑරීමේ දී වැදගත්ම සාහිත්‍ය මූලාශ්‍රය මහා වංසයයි.''

(i) මහා වංසයේ විස්තරවන මහින්දාගමනයේ ඓතිහාසිකත්වය සනාථ කරගැනීමට උපකාරීවන සෙල්ලිපි පිහිටි ස්ථාන දෙකක් නම් කරන්න. (ල.02)

(ii) ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය හැදෑරීමේ දී මහාවංසයේ ඇති වැදගත්කම සැකෙවින් දක්වන්න. (ල.06)

(iii) ඉතිහාසය හැදෑරීමට උපයෝගී කරගත හැකි මූලාශ්‍රයක් ලෙස මහාවංසයේ දැකිය හැකි දුර්වලතාවයන් පරීක්ෂා කරන්න. (ල.08)

(ල. 16)

03 රජරට ශිෂ්ටාචාර අවධියේ ශ්‍රී ලංකාවේ වාරිමාර්ග කටයුතුවල දැකිය හැකි කැපීපෙනෙන ලක්ෂණ පහත දැක්වෙන ක්ෂේත්‍රයන් යටතේ විස්තර කරන්න.

(i) අවශ්‍යතාවය

(ii) වාරිමාර්ග ක්‍රම

(iii) රාජ්‍ය අනුග්‍රහය

(iv) වාරි තාක්ෂණය

(ල.16)

04 පහත සඳහන් කරුණු පොළොන්නරු රාජධානිය පරිහානියට හා බිඳවැටීමට හේතු වූ ආකාරය ප්‍රමාණය කරන්න.

(i) විජයබාහු රජතුමාගේ විදේශ ප්‍රතිපත්තිය.

(ii) මහා පැරකුම් රජුගේ කාර්ය සංසිද්ධිය.

(ල.16)

05 පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) රජරට ශිෂ්ටාචාරයේ ආර්ථිකය

(ii) දෙවන පැරකුම්රජුගේ කාර්යභාරය

(iii) යාපන රාජධානිය

(iv) අලකේශ්වර පරපුර

(එක් කෙටි සටහනකට ලකුණු 08 බැගින්)

## C කොටස

06 ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශයේ පෘතුගීසීන් හා ලන්දේසීන් ගෙනගිය පාලන ප්‍රතිපත්තියේ කැපීපෙනෙන ලක්ෂණ සංසන්දනාත්මකව විග්‍රහ කරන්න. (ල.16)

07 බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයට එරෙහිව ඇතිවූ 1848 පොදුජන අරගලය ලංකා ඉතිහාසයේ හැරවුම් ලක්ෂයක් විය.

(i) අරගලයේ මූලස්ථානය බවට පත් නගරය කුමක් ද? (ල.01)

(ii) පොදුජන අරගලයේ නායකයන් දෙදෙනෙකු නම් කරන්න. (ල.02)

(iii) 1848 අරගලයට තුඩුදුන් ආසන්නතම සාධක සැකෙවින් විස්තර කරන්න. (ල.04)

(iv) 1848 අරගලයේ ප්‍රතිඵල සැකෙවින් විස්තර කර ඒවා ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන ප්‍රතිපත්තියේ වෙනසක් ඇතිකිරීමට හේතු වූ ආකාරය පරීක්ෂා කරන්න. (ල.09)


08 බ්‍රිතාන්‍යයන් විසින් 1931 වසරේ හඳුන්වාදුන් ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැකිය හැකි කැපීපෙනෙන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ල.16)

09 පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

1. උඩරට නායක්කර් රජ පරපුර
2. බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශයේ පාලනය
3. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ හා වතු වගාව
4. ආගමික පුනරුද ව්‍යාපාරයේ කැපීපෙනෙන ලක්ෂණ

(එක් කොටසකට ලකුණු 08 බැගින්)

- අංක 01 ප්‍රශ්නය සඳහා අදාළ ඉන්දියාවේ ආකෘති සිතියම.




LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න